ශ්‍රී ලංකා මහ බැංකුව

**2025 ජනවාරි 01** **චක්‍රලේඛය** **2025 අංක 01**

**(මෙය 2025 ජනවාරි 01 දින නිකුත් කරන ලද 2025 අංක 01 දරන චක්‍රලේඛයේ සිංහල පරිවර්තනයකි)**

**2024 අංක 04 දරන බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහන සැලසීම යන චක්‍රලේඛය සඳහා වන අතිරේකය**

2024 අංක 04 දරන "බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහන සැලසීම" යන චක්‍රලේඛයේ දක්වා ඇති සහන සියලුම බලපත්‍රලාභී බැංකු මගින් ඵලදායී සහ ඒකාකාරී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ අරමුණින්, එකී චක්‍රලේඛය තවදුරටත් පැහැදිලි කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව එම චක්‍රලේඛයට අදාළව පහත අතිරේකය මෙයින් නිකුත් කරනු ලැබේ.

බලපත්‍රලාභී බැංකු විසින් මෙම චක්‍රලේඛය යටතේ වන සහන ලබා දීම ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම උදෙසා සහන බැංකු ඒකකයක් ස්ථාපිත කළ යුතු අතර, 2024 අංක 02 දරන "බලපත්‍රලාභී බැංකු තුළ ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම සඳහා මාර්ගෝපදේශ" යන චක්‍රලේඛය යටතේ ස්ථාපිත කර ඇති දැනට පවතින ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක, එමගින් අපේක්ෂිත අරමුණු ඉටු කරගැනීම උදෙසා එලෙසම ක්‍රියාත්මක වනු ඇත.

පහත සඳහන් ඡේදය අංක 1.4 ලෙස ඇතුළත් කරනු ලබන අතර පවතින 1.4 ඡේදය අංක 1.5 ලෙස ප්‍රති අංකනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| **1.** සහනයන්හි ලක්ෂණ | 1.4 | ණය ගනුදෙනුකරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව සහ පිළිගත හැකි ව්‍යාපාර යළි පණ ගැන්වීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකු විසින් මුල් ගිවිසුම මගින් වසර දහයකට වඩා වැඩි කාලයක් ණය පියවීමට ලබා දී නොමැති නම්, අවස්ථානුකූලව, සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන්ගේ ණය පහසුකම් වසර දහයක උපරිම කාලයක් දක්වා ප්‍රතිලේඛනගත කළ හැකිය. මේ සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකුව සහ සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවා විසින් පවතින වෙළඳපොළ පදනම් පොලී අනුපාතික ද සැලකිල්ලට ගනිමින් පොලී අනුපාතික ද අතුළත්ව නියමයන් හා කොන්දේසි වලට එකඟ විය යුතුය. |

පහත සඳහන් ඡේදය අංක 3.3 ලෙස ඇතුළත් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| **3.** | ණය සහන ලබාදීමේ විනිවිදභාවය | 3.3 | වෙන්දේසි කරන ලද දේපළ තක්සේරු කිරීම පිළිබඳව බැංකුව සහ ණය ගනුදෙනුකරු අතර ඇතිවිය හැකි ඕනෑම ආරවුලක් සම්බන්ධයෙන් විනිවිදභාවයෙන් යුතු දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කරන ලෙස බලපත්‍රලාභී බැංකුවලින් ඉල්ලා සිටිනු ලැබේ. |

පහත සඳහන් ඡේදය අංක 4.1 ලෙස ඇතුළත් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| **4.** | වාර්තා කිරීමේ අවශ්‍යතාවය | 4.1 | 2025.01.31 දින සිට, බලපත්‍රලාභී බැංකු විසින් ඇමුණුම (A) හි දක්වා ඇති පරිදි, මෙම චක්‍රලේඛය යටතේ ණය ගනුදෙනුකරුවන්ට ලබා දී ඇති සහන ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර, සෑම මසකම අවසානයේ සිට වැඩ කරන දින 15ක් ඇතුළත බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතුය. |

අත්සන් කළේ,
**ආචාර්ය පී නන්දලාල් වීරසිංහ**
පාලක මණ්ඩල සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකු අධිපති

මෙහි ඇමුණුම (A) පහත සඳහන් සබැඳිය ඔස්සේ ලබා ගත හැක.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_circular_no_1_of_2025e.pdf